EDCS
අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவுச் சங்கம்
Education Co-operative Society

# නීතිඥයින් හා තක්සේරුකරුවන් ලියාපදිංචි කිරීම - 2027

දිවයිනේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු 226,000 පමණ සාමාජිකත්වයෙන් සැදුම්ලත් අධ්‍යාපන සමුපකාර සමිතිය මගින් ක්‍රියාත්මක කරනු ලබන දේපළ ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම් කරන සාමාජිකයින්ගේ දේපළ සුරකුම් වශයෙන් තබා ණය නිකුත් කරනු ලබයි.

එම දේපළවලට අදාළව හිමිකම් වාර්තා, තක්සේරු වාර්තා ලබාගැනීම, දේපළ ණය ගොනු පරීක්ෂාකර ණය ලබාදීමේ යෝග්‍යතාවය සහතික කිරීම හා උකස්කර හා විකුණුම්කර ලිවීම සඳහා පහත සුදුසුකම් සපුරා ඇති නීතිඥවරුන් හා තක්සේරුකරුවන් ලියාපදිංචි කරගැනීමට අපේක්ෂා කෙරේ.

- **හිමිකම් වාර්තා/ණය ලබාදීමේ යෝග්‍යතාවය සහතික කිරීම හා උකස්කර හා විකුණුම්කර ලිවීම**

  නොතාරිස් බලපත්‍රලාභී නීතිඥයකු ලෙස අවම වශයෙන් අවුරුදු 10 ක සිවිල් අධිකරණ හා නොතාරිස් කටයුතු පිළිබඳ පළපුරුද්ද.

- **තක්සේරු වාර්තා :**

  1975 අංක 33 දරන පනතින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ සාමාජිකත්වය සමඟ රාජ්‍ය හෝ පිළිගත් ආයතනයක තක්සේරුකරුවකු වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්ද.

ලියාපදිංචි වීමට අදහස් කරන ඉහත සුදුසුකම් සපුරා ඇති වෘත්තිකයින්, ඔවුන්ගේ සියලු සුදුසුකම් හා විස්තර ඇතුළත්ව සකස් කරන ලද අයදුම්පත, වෘත්තීය සහතිකවල ඡායා පිටපත්ද ඇතුළත් කර 2026/10/30 දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය.

සමිතිය දිවයිනේ සියලු පරිපාලන දිස්ත්‍රික්කයන්ට අයත් අධ්‍යාපන කලාප පදනම් කරගනිමින් ඉහත සේවා සඳහා වෘත්තිකයින් ලියාපදිංචි කිරීමට තීරණය කර ඇති බැවින් ඔබගේ සේවය ලබාදීමට අදහස් කරන දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප අයදුම්පත්‍රයේ පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ,

**"වෘත්තීය සේවා සඳහා ලියාපදිංචි වීම - නීතිඥයින්"** යනුවෙන් නීතිඥ අයදුම්කරුවන්ද,

**"වෘත්තීය සේවා සඳහා ලියාපදිංචි වීම - තක්සේරුකරුවන්"** යනුවෙන් තක්සේරුකාර අයදුම්කරුවන්ද සඳහන් කර තිබිය යුතු වේ.

**ප්‍රධාන ලේකම්,**
**සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය,**
**අංක 294, ගාලු පාර .කොළඹ 03.**
**දුරකථන : 011-2266000 Ex – 1006/1013**
**විද්‍යුත් තැපෑල : edcsloansec@gmail.com**